# මාගධී ප්‍රාකෘත භාෂා ලක්ෂණ (ප්‍රාකෘත ප්‍රකාශයෙහි එකොළොස් වන පරිච්ඡේදය ඇසුරෙනි)

පූජ්‍ය පෑළගම ධම්මික හිමි

වරරුචි ආචාරවරයා විසින් රචිත ප්‍රාකෘත ප්‍රකාශය පරිච්ඡේද දොළසකින් පරිමිත වෙයි. මෙහි එකොළොස් වන පරිච්ඡේදය මාගධී නම් වෙයි. මගධ දේශයෙහි භාවිත වූ භාෂාව මාගධී නමින් හඳුන්වයි. 'මගධානං භාෂා මාගධී' පැරණි මගධ දේශයෙහි ව්‍යහාර වූ ප්‍රාකෘතය මාගධී ප්‍රාකෘත නම්. නාට්‍යවල පහත් අය ද, විදේශිකයෝ ද, ජෛන සාධුවරු, නාගරාරක්ෂකයන්, කාර්මිකයන් වැනි අය කථා කළේ මාගධී ප්‍රාකෘතයෙනි, මාගධී ප්‍රාකෘතයෙහි භාෂා ලක්ෂණ සූත්‍ර වෘත්ත උදාහරණ අනුසාරයෙන් දත හැකිය. **(මගධානාං භාෂා මාගධී ලක්ෂ්‍ය ලක්ෂණාභ්‍යාං ස්ඵුටී ක්‍රියතෙ)** ප්‍රාකෘත ප්‍රකාශයෙහි එකොළොස් වන පරිච්ඡේදය මාගධී ප්‍රාකෘත භාෂා ලක්ෂණ උගන්වනු ලබයි. මෙහි දී සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1969. මුද්‍රිත කේ.ඇම්.ඩබ්ලිව්. කුරුප්පු මහතාගේ සංස්කරණයක් වූ ප්‍රාකෘත ප්‍රකාශ නම් ග්‍රන්ථයෙන් සියලු සූත්‍ර හා වෘත්ති උද්ධරණය කරන ලදී.

**ප්‍රකෘතිඃ ශෞරසෙනී**

**(අස්‍යා මාගධ්‍යාඃ ප්‍රකෘතිඃ ශෞරසෙනීති වෙදිතව්‍යම්)**

මාගධී ප්‍රාකෘතයෙහි භාෂා මූලය ශෞරසේනි නම් ප්‍රාකෘය වේ.

**ෂසො ශඃ**

**(ෂකාර සකාරයොඃස්ථානෙ ශො භවති)**

ෂකාර සකාර දෙකට ශකාරය වෙයි.

උදාහරණඃ-

මාෂඃ

මාශෙඃ (ෂසො ශඃ11.3)

මාශෙඃ (එවසුපාඝ්‍යඞඩසොඃ 5.12)

උදාහරණ:-

විලාසඃ

විලාශෙඃ (ෂසො ශඃ11.3)

විලාශෙ (එවසුප්‍යඩ්ඩසොඃ 5.12)

**ජො යඃ**

**(ජකාරස්‍ය යකාරො භවති)**

ජකාරයට යකාරය වෙයි.

උදාහරණ:-

ජායතෙ

යායතෙ (ජො යඃ11.4)

**චවර්ගස්‍ය ස්පෂ්ටතා තථොච්චාරණඃ**

**(චවර්ගො යථා ස්පෂ්ප ස්තථොච්චාරණො භවති)**

යම් සේ චවර්ගීය අක්‍ෂර පැහැදිලි වේද ඉතා පැහැදිලි ලෙස උච්ඡාරණය කළ යුතු වෙයි.

උදාහරණ:-

පරිචයඃ

පලිචයඃ (හරිද්‍රාදීනාං රො ලඃ2.30)

පලිචයෙ (එවසුප්‍යඩ්ඩසොඃ 5.12)

පලිචඑ (කගචජතදපයවාප්‍රායො ලොපඃ2.2)උදාහරණ:-

ගෘහීතච්ඡලඃ

ගහීතච්ඡලඃ (ඍතො ත්1.27)

ගහිතච්ඡලඃ (ඉදීතඃ පාණියාදීෂු 1.18)

ගහිදච්ඡලඃ (ඍත්වාදිෂු තො දඃ 2.7)

ගහිදච්ඡලෙ (එවසුප්‍යඩ්ඩසොඃ 5.12)

උදාහරණ:-

විජලඃ

වියලඃ (ජො යඃ11.4)

වියලෙ (එවසුප්‍යඩ්ඩසොඃ 5.12)

උදාහරණ:-

නිර්ඣරඃ

ණිර්ඣරඃ (නො ණඃ සර්වත්‍ර 2.42)

ණිඝධරඃ (සර්වත්‍ර ලවාරම් 3.3)
ණිජ්ඣරඃ (වර්ගෙෂු යුජඃ පූර්වඃ 3.51)
ණිජ්ඣලඃ (හරිද්‍රාදීනාං රො ලඃ2.30)
ණිජ්ඣලෙ (එවසුපාඃඩිඩසොඃ 5.12)
**හෘදයස්‍ය හඩක්කඃ**
**(හෘදයස්‍ය ස්ථානෙ හඩක්කො භවති)**
හෘදය ශබ්දයට හඩක්ක යන්න ආදේශ වෙයි.

උදාහරණඃ-
හෘදයෙ ආදරො මම - හඩක්කෙ ආලලෙ මම
**යී ජීයො ය්‍යඃ**
**(යීකාර ජීකාරයොඃ ස්ථානෙ ය්‍යො භවති)**
යී ජී යන සංයෝගයන්ට ය්‍ය ආදේශ වෙයි.

උදාහරණඃ-
කායයීං
කායෙය්‍ය (යී ජීයො ය්‍යඃ11.7)

උදාහරණඃ-
දුජීනඃ
දුය්‍යනඃ (යී ජීයො ය්‍යඃ11.7)
දුය්‍යණඃ (නො ණඃ සර්වත්‍ර 2.42)
දුය්‍යණෙ (එවසුපාඃඩිඩසොඃ 5.12)
**ක්‍ෂස්‍ය ස්කඃ**
**(ක්‍ෂ ස්‍ය ස්ථානෙ ස්ක කාරො භවති)**
ක්‍ෂ යන සංයෝගයට ස්ක ආදේශ වෙයි.

උදාහරණඃ-
රාක්‍ෂසඃ
රාස්කසඃ (ක්‍ෂස්‍ය ස්කඃ 11.8)
ලාස්කසඃ (හරිද්‍රාදීනාං රො ලඃ2.30)
ලස්කසඃ (අදාතො යථාදිෂු වා 1.10)
ලස්කශඃ (ෂසො ශඃ 11.3)
ලස්කශෙ (එවසුපාඃඩිඩසොඃ 5.12)

උදාහරණ:-

දක්‍ෂඃ

දස්කඃ (ක්‍ෂස්‍ය ස්කඃ 11.8)

දස්කෙ

**අස්මදඃ සෞ හකෙ හගෙ අහකෙ**

**(අස්මදඃ ස්ථානෙ සෞ පරතො හකෙ හගෙ අහකෙ ඉත්‍යෙත ආදෙශො භවන්ති)**

අස්මද් ශබ්ද සුවිභත්තියට (ප්‍රථමා විභත්ති ඒකවචනය) හකෙ හගෙ අහකෙ යන්න ආදේශ වෙයි.

උදාහරණ:-

අහං භණාමි - හකෙ භණාමි

අහං භණාමි - හගෙ භණාමි

අහං භණාමි - අහකෙ භණාමි

**අත ඉදෙතෞ ලුක් ච**

**(සාවිත්‍යනු වර්තතෙ අකාරාන්තාච්ඡබ්දාත් සෞ පරත ඉකාරෙකාරෞ භවතඃ පක්‍ෂෙ ලොපශ්ච)**

අකාරාන්ත නාමපදවල ප්‍රථමා ඒකවචනයට ඉ ඒ වේ වෙයි.

උදාහරණ:-

එෂ රාජා

එෂෙ රාජා (අත ඉදෙතෞ ලුක් ච 11.10)

එශෙ රාජා (ෂසො ශඃ 11.3)

එශෙ ලාජා (හරිද්‍රාදීනාං රො ලඃ2.30)

එශෙ ලාආ (කගචජතදපයවාප්‍රායො ලොපඃ2.2)

**ලෝප වූ විට - එශලාආ**

උදාහරණ:-

එෂ පුරුෂඃ

එෂි පුරිෂඃ (අත ඉදෙතෞ ලුක් ච 11.10)

එශි පුරිශඃ (ෂසො ශඃ 11.3)

එශි පුලිශඃ (හරිද්‍රාදීනාං රො ලඃ2.30)

එශි පුලිශ

ලෝප වූ විට - එශපුලිශ

ක්තාන්තාදුශ්චඃ

(ක්ත ප්‍රත්‍යන්තාච්ඡබ්දාත් සෞ පරත උකාරශ්ච භවති චකාරාත් ඉදෙතෞ ලුක් ච)

ප්‍රථමා ඒකවචනය පර කල්හි ක්ත ප්‍රත්‍යාන්ත ශබ්දයන්ට උකාර වෙයි. චකාරයේ බලයෙන් ඉ ඒ ලොප් වෙයි.

උදාහරණඃ-

හසිතඃ

හසිතු (ක්තාන්තාදුශ්චඃ 11.11)

හශිතු (ෂසො ශඃ 11.3)

හසිදු (ඍත්වාදිෂු තො දඃ 2.7)

ලොප් වූ විට - හශිද

ඞසො හොවා දීඝීත්වඤ්ච

(ඞසඃෂෂ්ඨ්‍යක වචනස්‍ය ස්ථානෙ හකාරාදෙශො වා භවති තත් සංයොගෙ දඝීත්වම්)

ඞස් (ෂෂ්ඨී) විභත්ති ඒකවචනයට විකල්පයෙන් හකාර වේ ශබ්දාන්තය දීර්ඝ වෙයි.

උදාහරණඃ-

පුරුෂස්‍ය

පුරුෂාහ (ඞසො හොවා දීඝීත්වඤ්ච 11.12)

පුලුෂාහ (හරිද්‍රාදීනාං රො ලඃ2.30)

පුලිෂාහ (ඉත් පුරුෂෙ රොඃ 1.23)

පුලිශාහ (ෂසො ශඃ 11.3)

විකල්පයෙන් - පුලිශශ්ශ

අදීසීඃ සම්බුද්ධෞ

(අදන්තාදිත්‍යොව අදන්තාච්ඡබ්දා දකාරො දීඝො භවති සම්බුද්ධෞ)

අකාරාන්ත ශබ්දවල සම්බෝධන විභක්තිය ප්‍රත්‍ය දීර්ඝ වෙයි.

උදාහරණඃ-

පුරුෂ

පුරුෂා (අදීසීඃ සම්බුද්ධෞ 11.13)

පුලුෂා (හරිද්‍රාදීනාං රො ලඃ2.30)
පුලිෂා (ඉත් පුරුෂෙ රොඃ 1.23)
පුලිශා (ෂසො ශඃ 11.3)
**චිට්ඨස්‍ය චිෂ්ටඃ**
**(චිට්ඨස්‍ය ස්ථානෙ චිෂ්ට ඉත්‍යය මාදෙශො භවති)**
චිට්ඨ යන්නට චිෂ්ට යන්න ආදේශ වෙයි.

උදාහරණඃ-
ස්තිෂ්ඨති
චිෂ්ටති (චිට්ඨස්‍ය චිෂ්ටඃ 11.14)
චිෂ්ටදි (ඍත්වාදිෂු තො දඃ 2.7)
**කෘඤ් මාඞ ගමාං ක්තස්‍ය ඩඃ**
**(ඩු කෘඤ් කරනෙ මාඞ ප්‍රාණත්‍යාගෙ ගම්ලු ගතෞ එතෙෂාං ක්තප්‍රත්‍යයස්‍ය ස්ථානෙ ඩකාරො භවති)**
කෘ මෘ ගම් ධාතුවලින් පරව ත ප්‍රත්‍යයට ඩ ආදේශ වෙයි.

උදාහරණඃ-
කෘතඃ
කෘඩඃ (කෘඤ් මාඞ ගමාං ක්තස්‍ය ඩඃ 11.15)
කඩඃ (ඍතො'ත් 1.27)
කඩෙ (එවසුප්‍යාඞ්ඛසොඃ 5.12)

උදාහරණඃ-
මෘතඃ
මෘඩඃ (කෘඤ් මාඞ ගමාං ක්තස්‍ය ඩඃ 11.15)
මඩඃ (ඍතො'ත් 1.27)
මඩෙ (එවසුප්‍යාඞ්ඛසොඃ 5.12)

උදාහරණඃ-
ගතඃ
ගඩඃ (කෘඤ් මාඞ ගමාං ක්තස්‍ය ඩඃ 11.15)
ගඩෙ (එවසුප්‍යාඞ්ඛසොඃ 5.12)
**ක්ත්වො දාණිඃ**
**(ක්ත්වා ප්‍රත්‍යයස්‍ය ස්ථානෙ දාණි ඉත්‍යය මාදේශො භවති)**
ක්ත්වා ප්‍රත්‍යයට දාණි ආදේශ වෙයි.

උදාහරණ:-

කෘත්වා

කරදාණි (ක්ත්වො දාණිඃ 11.16)

**ශෘගාලස්‍ය ශි ආලාශි ආලෙ ශි ආලකාඃ**

**(ශෘගාල ශබ්දස්‍ය ස්ථානෙ ශිආලාදය ආදෙශො භවන්ති)**

ශෘගාල ශබ්යට ශිආලා, ශිආලෙ, ශිආලකෙ යනාදේශයෝ වෙති.

උදාහරණ:-

ශෘගාල

ශිආලා (ශෘගාලස ්‍යශි ආලාශි ආලෙ ශි ආලකඃ 11.17)

උදාහරණ:-

ශෘගාල

ශිආලෙ (ශෘගාලස ්‍යශි ආලාශි ආලෙ ශි ආලකඃ 11.17)

උදාහරණ:-

ශෘගාල

ශිආලකෙ (ශෘගාලස ්‍යශි ආලාශි ආලෙ ශි ආලකඃ 11.17)

ආශ්‍රිත ග්‍රන්ථ

1. ප්‍රාකෘත ප්‍රකාශ කුරුප්පු කේ.ඇම්.ඩබ්ලිව්. සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1969
1. ප්‍රාකෘතප්‍රකාශඃ වරරුචි ආචාරීන්
2. ප්‍රාකෘත සංග්‍රහය හෙට්ටි ආරච්චි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1947